# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/62 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීතීන් හි 15 වන ආකෘතිය (20 වන රීතිය)**

අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමේ නියෝගය.

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය. (වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)**

කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 114 දරන ස්ථානයේ හි පිහිටි, ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්, ආයතනය පිළිබඳ කාරණාවයි.

තවද,

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 31(5)(ආ) සහ 32 වගන්ති යටතේ ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්, ආයතනය ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා වන ඉල්ලීමක් පිළිබඳ කාරණය ගැනයි.

නඩු අංක : **CHC 43/2023/CO**
ස්වාභාවය : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : ලඝු

කොළඹ 01, ජනාධිපති මාවත, අංක 30 දරන ස්ථානයෙහි පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ, රාජපක්ෂ මුදියන්සේලාගේ චතුරි හර්ෂිකා කුරවතුර ජයසිංහ.

**පෙත්සම්කරු**



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පෙත්සම හා අනෙකුත් කරුණු සළකා බැලීමෙන් අනතුරුව කොළඹ වාණිජ මහාධිකරණය විසින් 2023 දෙසැම්බර් මස 15 වැනි දින ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් අධිකරණ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීමට නියම කරන ලදී; තවද ඈවරකරු වශයෙන් කොළඹ 04, කාසල් පටුමග, අංක 11, 03 වන මහල, එස් ජේ එම් එස් ඇසෝසියේට්ස් / බාරේ යන ලිපිනය දරන ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා පත් කිරීමට අධිකරණය නියෝග කරන ලදී. එකී සමාගම ඈවරකිරීමේ කාර්යය සඳහා ඈවරකරු වශයෙන් පත් කරන ලද ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් මහතා විසින් 2024 ජනවාරි මස 26 වැනි දින සහ ඉන්පසුව සෑම තුන් මාසයක් පාසාම මෙම සමාගම ගණන් බේරා වසාදැමීම සම්බන්ධ තත්වය හා ප්‍රගතිය පෙන්නුම් කරන්නාවූ සහ එකී වත්කම් මුදල් කිරීම හෝ සමාගම ගණන් බේරා වසා දැමීම හා සම්බන්ධිත වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් කලින් කලට අධිකරණය මඟින් නියෝග කරන යම් කාරණයක් සම්බන්ධව වූ ලිඛිත වාර්තාවක් කොළඹ වාණිජ මහාධිකරණයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් නියෝග කරන ලදී. තවද, බිල්පත් ගාස්තු අය කිරීම හෝ වියදම් හෝ සමාගමේ ඈවරකරු විසින් සේවයට බඳවා ගන්නා ලද නීතිඥවරයෙකුගේ විශේෂ දීමනාවක් හෝ එකී ඈවරකරුගේ හෝ යම් කළමනාකරුවෙකුගේ, ගණකාධිකාරීවරයෙකුගේ, වෙන්දේසිකරුවකුගේ, හෝ වෙනත් අයෙකුගේ යම් වේතන, අයකිරීම් හෝ වියදම් අධිකරණයේ ලේකම් විසින් තක්සේරු කර හෝ අවසර දී නොමැතිව සමාගමේ වත්කම් වලින් නොගෙවිය යුතු බවට අධිකරණය නියෝග කරන ලදී. තවද, ඒ අනුව එවැනි ගාස්තු, අය කිරීම්, වියදම් සහ වේතන තක්සේරු කිරීම සහ තහවුරු කිරීම කළ යුතු බවටද, නියෝග කරන ලදී, තවද, පෙත්සම්කරුගේ වියදම් ද ඇතුළුව සමාගමේ ණය හිමියන්ට, සහදායකයන්ට, සහ ඉහත කී ඈවරකරුට සහ උනන්දුවක් දක්වන වෙනත් සියලුම තැනැත්තන්ට අවස්ථාවෝචිත පරිදි සාමාන්‍යයෙන් අයදුම් කිරීමට නිදහස තිබිය යුතු බවට ද අධිකරණය නියෝග කරන ලදී.

අධ්‍යක්ෂ,
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.